OL/2009/16-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**16 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

| | | |
|---|---|---|
| ඉස්ලාම් | I, II | පැය තුනයි |
| இஸ்லாம் | I, II | மூன்று மணித்தியாலங்கள் |
| Islam | I, II | Two hours |

## ඉස්ලාම් I

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

(v) **I හා II පිළිතුරු පත්‍ර එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා භාර දෙන්න.**

1. මුස්ලිම්වරයකු තම ස්තුතිය ප්‍රකාශ කිරීම සඳහා යොදා ගන්නා පදය
   (1) බාරකල්ලාහ් (2) ජසාඅකල්ලාහු හයිරන්
   (3) ෂුක්රන් (4) අස්තඃ පිරුල්ලාහ්

2. 'සුබ්හාන රබ්බියල් අඃලා වබි හම්දිහි' යන තස්බීහය පාරායණය කරනුයේ
   (1) තක්බීර් බැඳීමේ දී ය. (2) ඉඃතිදලයේ සිටීමේ දී ය.
   (3) රුකූඋවේ සිටීමේ දී ය. (4) සුජූදයේ සිටීමේ දී ය.

3. නීති මූලාශ්‍ර අතුරෙන් වහී මත්ලූව් මගින් ලබා ගන්නා මූලාශ්‍රය යනු
   (1) අල්-කුර්ආන් ය. (2) අල්-ඉජ්මා ය.
   (3) අල්-කියාස් ය. (4) අල්-උර්ෆ් ය.

4. සිහාත් සිත්තාවට අයත් නොවන හදීස් ග්‍රන්ථ දෙකක් වනුයේ
   (1) සහීහ් බුහාරි සහ සහීහ් මුස්ලිම් ය. (2) සුනන් අබූ දවූද් සහ ජාමිඋත් තිර්මිදි ය.
   (3) මුවත්තා සහ මිෂ්කාතුල් මසාබීහ් ය. (4) සුනන් නසාඊ සහ සුනන් ඉබ්නු මාජා ය.

5. 'හුකූකුල් ඉබාද්' යනු
   (1) මිනිසා අල්ලාහ්ගේ සියලු මැවීම් සඳහා ඉටු කරන යුතුකම් ය.
   (2) මිනිසා දෙවිදූතන්ට ඉටු කරන යුතුකම් ය.
   (3) මිනිසා අනෙකුත් මිනිසුන් සඳහා කරන යුතුකම් ය.
   (4) මිනිසා තමා සඳහා කරන යුතුකම් ය.

6. සුන්නත් වල් ජමාඅතයට අයත් මද්හබ්වලින් මුලින් ම බිහි වූයේ
   (1) ෂාෆි මද්හබ් ය. (2) හනෆි මද්හබ් ය. (3) මාලිකි මද්හබ් ය. (4) හම්බලි මද්හබ් ය.

7. නබි මුහම්මද් (සල්) තුමාගේ වචන, ක්‍රියා හා අනුමැතිවලින් සමන්විත වූවකි,
   (1) ඉජ්තිහාද්. (2) ඉජ්මාඋ. (3) හදීස්. (4) අල්-කුර්ආනය.

8. 'ජරාඉමුල් හුදූද්' වර්ගයට අයත් වැරදි වන්නේ
   (1) සැලසුම්ගත ඝාතනය සහ අනියම් ඝාතනයයි.
   (2) මත්ද්‍රව්‍ය වෙළෙඳාම සහ රජයට හොරෙන් කරන භාණ්ඩ පිටකිරීමයි.
   (3) සැලසුම්ගත තුවාල කිරීම් සහ අතපසු වීමකින් තුවාල සිදුවීමයි.
   (4) වෛශ්‍යා වෘත්තිය සහ සොරකමයි.

[ දෙවැනි පිටුව බලන්න.

9. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් විසින් හඳුන්වා දෙනු ලැබූ වෛද්‍ය ක්‍රමය වන්නේ
   (1) යුනානි වෛද්‍ය ක්‍රමයයි.  (2) බටහිර වෛද්‍ය ක්‍රමයයි.
   (3) ආයුර්වේද වෛද්‍ය ක්‍රමයයි.  (4) මන්ත්‍ර වෙදකමයි.

10. මරණයට පත්වූ තම මව වෙනුවෙන් ළිඳක් භාරා වක්ෆ් කළ සහාබිවරයා
   (1) අබූ හුරයිරා (රළි) ය.  (2) උස්මාන් (රළි) ය.
   (3) සෑද් ඉබ්නු උබාද (රළි) ය.  (4) සල්මාන් (රළි) ය.

11. රමලාන් මාසයේ අවසන් දින දහයේ දී ඉටු කළ යුතු බවට අවධාරණය කර ඇති සුන්නත් ක්‍රියාවක් වනුයේ
   (1) උම්රා ය.  (2) කියාමුල්ලයිල් ය.  (3) තරාවීහ් ය.  (4) ඉෑතිකාෆ් ය.

12. නබි (සල්) තුමාගෙන් 'දිග අත් ඇති තැනැත්ති' යන විරුදාවලිය ලැබුයේ
   (1) සයිනබ් බින් ජහ්ෂ් (රළි) ය.  (2) ජුවෛයිරියා (රළි) ය.
   (3) උම්මු සල්මා (රළි) ය.  (4) හෆ්සා (රළි) ය.

13. මුස්ලිම්වරයකුගේ දේපළ පිරිසිදු කරන ඉබාදතය වන්නේ
   (1) හජ් වන්දනාව ය.  (2) සලාතය ය
   (3) සකාතය ය.  (4) උපවාස ශීලය ය.

14. තම සියලු කටයුතු අල්ලාහ්ට භාර කිරීමේ ක්‍රියාව හඳුන්වනු ලබන්නේ
   (1) තවක්කුල් යනුවෙනි.  (2) කව්ෆ් යනුවෙනි.
   (3) රිලා යනුවෙනි.  (4) රජාඋ යනුවෙනි.

15. මිනා, සෆා, මර්වා, මුස්තලිෆා යන ස්ථාන හා සම්බන්ධ ඉබාදතය
   (1) සලාත් නම් වේ.  (2) උම්රා නම් වේ.
   (3) සව්ම් නම් වේ.  (4) හජ් නම් වේ.

16. උපවාසය අවලංගු වන ක්‍රියාවක් වන්නේ
   (1) කුසගින්න සමගින් උපවාසය ආරම්භ කිරීම ය.
   (2) දහවල් නින්දේ දී කටින් කෙළ හැලීම ය.
   (3) රාත්‍රියේ දීර්ඝ වේලාවක් නිදි වැරීම ය.
   (4) දරුවකු ප්‍රසූත කිරීම ය.

17. කත්මුන් නුබුව්වත් මූලධර්මය ප්‍රතික්ෂේප කරන්නන් මුස්ලිම් නොවන්නන් සේ සලකනුයේ
   (1) ඔවුන් මුස්ලිම්වරුන් සමග එක්ව සලාතය ඉටු නොකිරීම නිසා ය.
   (2) වෙනම මස්ජිද පිහිටුවා ගැනීම නිසා ය.
   (3) මුස්ලිම් සුසාන භූමියේ තම ජනාසා භූමදනය නොකිරීම නිසා ය.
   (4) මුහම්මද් (සල්) තුමා අවසාන නබි වශයෙන් නොපිළිගැනීම නිසා ය.

18. 'අ' කොටසේ ඇති පද සමග 'ආ' කොටසේ ඇති පද අනුපිළිවෙළින් නිවැරදිව ගළපා ඇති වරණය තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| (i) ඉමාම් බුහාරි (රහ්) | a අර් රිසාලා |
| (ii) ඉමාම් අබූ හනීෆා (රහ්) | b අල් කානූන් |
| (iii) ඉමාම් ෂාෆි (රහ්) | c අත්තරීහුල් කබීර් |
| (iv) ඉබ්නු සීනා (රහ්) | d ෆික්හුල් අක්බර් |

   (1) b, a, c, d  (2) c, a, d, b
   (3) c, d, a, b  (4) d, b, c, a

19. ඉමාම් මාලික් (රහ්) තුමාගේ ගෝලයකු වශයෙන් හා ඉමාම් අහ්මද් ඉබ්නු හම්බල් (රහ්) තුමාගේ ගුරුවරයෙකු වශයෙන් සැලකෙන විද්වතා
   (1) ඉමාම් අබූ හනීෆා (රහ්) ය.  (2) ඉමාම් ෂාෆි (රහ්) ය.
   (3) ඉමාම් බුහාරි (රහ්) ය.  (4) ඉමාම් මුස්ලිම් (රහ්) ය.

20. අබූබක්කර් (රළි) තුමාගේ පාලන සමයේ මුහුණ දුන් බලවත් ම අභියෝගය වූයේ
   (1) ඉස්ලාමීය කිලාෆතයේ බාහිර බලපෑම් ය.
   (2) අභ්‍යන්තර කැරැල්ල ය.
   (3) රටේ ඇතිවූ නියඟය ය.
   (4) ව්‍යාජ නබිවරුන් බිහි වීම ය.

21. පස්වරු 5.30ට කොළඹ සිට නුවර බලා පිටත් වූ ඔබට මැරිබ් සලාතය පිළිබඳ ගත හැකි සුදුසු ම ක්‍රියාමාර්ගය වනුයේ
(1) මැරිබ් සලාතය ඉටු කිරීමෙන් වැලකීම ය.
(2) මහනුවරට ගොස් ඉෂා සලාතය ඉටු කිරීම ය.
(3) මහනුවරට ගොස් මැරිබ් ඉෂා සමග යා කර ඉටු කිරීම ය.
(4) මහනුවරට ගොස් ඉෂා සලාතය ඉටු කර අනතුරුව මැරිබ් සලාතයත් ඉටු කිරීම ය.

22. වසරක් පුරා කෙනකු තම බාරයේ පරිහරණයට අමතරව ඇති රත්භාණ්ඩ වෙනුවෙන් සකාත් දිය යුතු ආරම්භක නිසාබ් වනුයේ
(1) ග්‍රෑම් 672 කට වඩා වැඩියෙන් තිබීම ය. (2) ග්‍රෑම් 85 කට වැඩියෙන් තිබීම ය.
(3) ග්‍රෑම් 20 කට වැඩියෙන් තිබීම ය. (4) ග්‍රෑම් 10 කට වැඩියෙන් තිබීම ය.

23. සාමූහික වෙළෙඳම සඳහා වූ කොන්දේසිවලින් එකක් වනුයේ
(1) සාමූහික වෙළෙඳමේ නිරතවන්නන් මුස්ලිම් විය යුතු ය.
(2) සේවකයින් ලාභාලාභයේ කොටස්කරුවන් කිරීම ය.
(3) ලාභයේ ප්‍රමාණය මුලින් ම තීරණය කර තිබීම ය.
(4) ලාභාලාභ අනුපාතය මුලින් ම තීරණය කර තිබීම ය.

24. මුස්ලිම් විවාහ නීතියට අනුව තම වැඩිමහල් සහෝදරියගේ දියණිය විවාහ කර ගැනීම නොපිළිගැනීමට මූලික හේතුව
(1) ඔවුන් දෙදෙනා මහ්රම් නිසා ය.
(2) ඔවුන් දෙදෙනා අජ්නබි නිසා ය.
(3) ඔවුන් එකිනෙකා අකමැත්තෙන් සිටීම නිසා ය.
(4) ඔවුන්ගේ වයස් පරතරය අනුව නුසුදුසු නිසා ය.

25. "ආගමේ බල කිරීමක් නොමැත" යනු
(1) අබ්දුල් කාදිර් ජීලානි (රහ්) තුමාගේ කියමනකි.
(2) කලීෆා උමර් (රලි) තුමාගේ කියමනකි.
(3) අල්-කුර්ආන් වාක්‍යයක අර්ථයයි.
(4) නබි (සල්) තුමාගේ හදීසයක අර්ථයයි.

26. මුස්ලිම්වරයකු මරණයට පත් වීමෙන් පසු ඔහුගේ දේපල ඥාතීන් අතර බෙදෙන ආකාරය විස්තර කෙරෙන ග්‍රන්ථය
(1) ඉල්මුල් හදීස් ය. (2) ඉල්මුල් කලාම් ය.
(3) ඉල්මුල් වරාසත් ය. (4) උලූමුල් කුර්ආන් ය.

27. ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් බහුතර නායකයින් සමග එකතුවී හඬ නැංවූ මුස්ලිම් නායක දෙපළ කවුද?
(1) එම්. සී. සිද්දි ලෙබ්බේ, ටී. බී. ජයා (2) ශ්‍රීමත් රාසික් ෆරීඩ්, ඒ. එම්. ඒ. අසීස්
(3) ටී. බී. ජයා, වාප්පිච්චි මරික්කාර් (4) ශ්‍රීමත් රාසික් ෆරීඩ්, එම්. සී. සිද්දි ලෙබ්බේ

28. ණය ගනුදෙනු වාර්තා කිරීම සඳහා නබි (සල්) තුමා විසින් පත් කරනු ලැබූ තැනැත්තා
(1) සයිද් ඉබ්නු සාබිත් (රලි) ය. (2) අම්රු ඉබ්නු උමයියා (රලි) ය.
(3) හාෂිම් ඉබ්නු බත්තආ (රලි) ය. (4) අබ්දුල්ලා ඉබ්නු අර්කම් (රලි) ය.

29. හදීස් වර්ග කිරීමට හේතු වූයේ
(1) හදීස් විද්වතුන්ගේ පෞද්ගලික නිගමන වීම ය.
(2) හදීස් ගොනු කිරීමේ දී සැක මතු වීම ය.
(3) ව්‍යාජ හදීස් බිහි වීම ය.
(4) අල්-කුර්ආනය සහ හදීස් මිශ්‍ර වීම ය.

30. 'මිනිසුන් අතර සුවිශේෂ වූ තැනැත්තා' වශයෙන් නබි (සල්) තුමාගේ ප්‍රශංසාවට ලක් වූයේ
(1) මිනිසුන්ට ප්‍රයෝජනවත් අයෙකි. (2) මිනිසුන්ට දන් දෙන අයෙකි.
(3) වැඩි වැඩියෙන් හජ් වන්දනා කරන අයෙකි. (4) සරල ජීවිතයක් ගත කරන අයෙකි.

31. 'අමීරුල් මූඃමිනීන්' යන නමින් ප්‍රථමයෙන් පාලනය කළ උමයියා කලීෆාවරයා වනුයේ
(1) අබූබක්කර් (රලි) ය. (2) මුආවියා (රලි) ය.
(3) කලීෆා අබ්දුල් රහ්මාන් ය. (4) කලීෆා අබුල් අබ්බාස් ය.

32. නීතිමය වලංගුතාව සඳහා 'ඊජාබ් කබූල්' මත රඳා පවතින්නේ පහත දැක්වෙන ඒවායින් කුමක් ද?
(1) විවාහය සහ වෙළෙඳම (2) විවාහය සහ තලාක්
(3) ඉද්දව සහ වෙළෙඳම (4) තලාක් සහ ඉද්දව

[ හතරවැනි පිටුව බලන්න.

33. ගැබිණි තත්ත්වයේ පසුවෙද්දී ස්වාමිපුරුෂයා අහිමි වූ කාන්තාවක ඉද්ද රැකිය යුතු කාලපරිච්ඡේදය
   (1) මාස හතරක් හා දින දහයකි.
   (2) මාස්ශුද්ධි කාලපරිච්ඡේද තුනකි.
   (3) දරුවා ප්‍රසූත කරන තෙක් ය.
   (4) වෛද්‍යවරයා හමුවන තෙක් ය.

34. කලීෆා උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමාගේ මැදහත් වීමෙන් ආරක්ෂා වූ ඉස්ලාමීය කලා ක්ෂේත්‍රය
   (1) තෆ්සීර් ය. (2) හදීස් ය. (3) ෆික්හ් ය. (4) ඉල්මුල්කලාම් ය.

35. ස්වාමි පුරුෂයාට කිසියම් ප්‍රමාණයක මුදලක් දී විවාහ ගිවිසුමෙන් ඉවත් වීමේ ක්‍රමය හඳුන්වන්නේ
   (1) තලාක් ය.
   (2) පස්හ් ය.
   (3) ලිහාර් ය.
   (4) කුල්ඌ ය.

36. මුහම්මද් (සල්) තුමාට පළමු වහී පහළ වූ ස්ථානය
   (1) කඃබාව ය.
   (2) මස්ජිදුන් නබවි ය.
   (3) හිරා ගුහාව ය.
   (4) තෞර් ගුහාව ය.

37. 'කියාස්' යනු
   (1) නීති මූලාශ්‍රවලින් එකකි.
   (2) වත්පිළිවෙත්වලින් එකකි.
   (3) ගනුදෙනු ක්‍රමයකි.
   (4) අල්ලාහ්ගේ නාමයකි.

38. හජ් වගකීමේ පර්ලුවලින් එකක් වනුයේ
   (1) අරෆාවේ රැඳී සිටීම ය.
   (2) ජම්රාහි දී ගල් ගැසීම ය.
   (3) මිනාහි රැඳී සිටීම ය.
   (4) සම්සම් ජලය පානය කිරීම ය.

39. තක්වාව ඇති කරන ඉබාදතයක් වශයෙන් අල්-කුර්ආනයේ අවධාරණය කරන ඉබාදතයක් වනුයේ
   (1) දන් දීම ය.
   (2) සලාතය ඉටු කිරීම ය.
   (3) උපවාසයේ නිරත වීම ය.
   (4) මස්ජිද් ඉදි කිරීම ය.

40. කර්බලා නම් ස්ථානයේ දී ඝාතනයට ලක්වූ නබි (සල්) තුමාගේ මුණුබුරා
   (1) ජඃෆර් (රළි) ය.
   (2) උසාමා (රළි) ය.
   (3) හසන් (රළි) ය.
   (4) හුසෙයින් (රළි) ය.

* *

[ පස්වැනි පිටුව බලන්න.

# ඉස්ලාම් II

※ **පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
※ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.
(i) 'තෞහිද්' යන පදයේ විරුද්ධාර්ථ පදය කුමක් ද?
(ii) සරල නජීසය යන්නට උදහරණයක් දෙන්න.
(iii) සලාතයේ ආරම්භක තක්බීරයෙන් අනතුරුව ඉටු කළ යුතු පර්ල් කටයුත්ත කුමක් ද?
(iv) ඉස්ලාමයෙන් ලබා දී ඇති මිනිස් අයිතිවාසිකම් දෙකක් නම් කරන්න.
(v) අපගේ ප්‍රාර්ථනා පිළිගනු ලැබීමට අප ගන්නා ආහාරපාන කෙසේ විය යුතු ද?
(vi) කාන්තාවන්ට හලාල් වූ සහ පිරිමින්ට හරාම් වූ ඇඳුම් පැළඳුම් නම් කරන්න.
(vii) මුස්ලිම්වරයෙකු මක්කා පුරවරයේ දී පමණක් ඉටු කළ යුතු ක්‍රියා දෙකක් නම් කරන්න.
(viii) සකාත් සඳහා වූ සියලු කොන්දේසි ඉටු වූ කෙනෙකු සතු රුපියල් ලක්ෂ දහයක මුදලකට හිමි සකාත් මුදල කිය ද?
(ix) ඉස්ලාමීය දඬුවම් වර්ග දෙක මොනවා ද?
(x) 'හුකුකුල් ඉබාද්' යන්නට උදහරණ දෙකක් දෙන්න.

**2.** (i) 'ෂිර්ක්' වර්ග නම් කරන්න.
(ii) කුෆ්රය ඇති කරන ප්‍රධාන සාධක නම් කරන්න.
(iii) මුස්ලිම්වරයකුගේ ජීවිතයේ ඊමානයේ බලපෑම් කවරේ ද?

**3.** (i) මුස්ලිම්වරයකු 'තයම්මුම්' කරන අවස්ථා කවරේ ද?
(ii) ජලයේ ස්වභාවය අනුව එය වර්ග කර ඇති ආකාරය සඳහන් කරන්න.
(iii) සලාතයේ සලාම් කී වහාම කරන සුන්නත් ක්‍රියා නම් කරන්න.

**4.** (i) විවාහයේ සුවිශේෂත්වය පැහැදිලි කරන හදීසයක් ලියන්න.
(ii) බහු විවාහයේ ප්‍රයෝජන කවරේ ද?
(iii) ඉද්දා ආරක්ෂා කරන කාන්තාවක් කුමන ආකාරයේ විනයක් පිළිපදී ද?

**5.** (i) පව් කමා කිරීම (තව්බා) සඳහා අවශ්‍ය කොන්දේසි මොනවා ද?
(ii) නබි මුහම්මද් (සල්) තුමා අවසාන නබි වශයෙන් පිළිගැනීමේ සාධක සඳහන් කරන්න.
(iii) සිත සැනසීම වෙනුවෙන් ඉස්ලාමයෙන් පෙන්වා දී ඇති ක්‍රියාමාර්ග මොනවා ද?

**6.** (i) උපවාසයේ ප්‍රධාන වර්ග නම් කරන්න.
(ii) සලාතය සාමූහිකව ඉටු කිරීමෙන් ලබා ගත හැකි ඵල ප්‍රයෝජන මොනවා ද?
(iii) සකාතය විධිමත් ව ඉටු කිරීමෙන් ඇති වන යහපත කුමක් ද?

**7.** (i) කලීෆා උමර් (රළි) තුමා තම පාලන කාලයේ දී මහජන සුභසිද්ධිය උදෙසා ගත් වැදගත් පියවර සඳහන් කරන්න.
(ii) උමයියා කලීෆාවරයකු වූ උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමාගේ පාලනයේ සුවිශේෂතා මොනවා ද?
(iii) ශ්‍රී ලංකාවේ ජාතික මෙහෙවරෙහි මුස්ලිම්වරුන්ගේ දයකත්වය කුමක් ද?

※ ※ ※